රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 49/89

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1989 ඔක්තෝබර් මස 09 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානයන් සහ
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත.

**1987 ජුලි/අගෝස්තු කාලය තුළ සිදුවූ දාමරික ක්‍රියා සහ ඉන්පසු සිදුවූ ත්‍රස්තවාදී දාමරික ක්‍රියා හේතුවෙන් අලාභ සිදුවූ හෝ විනාශ වූ රාජ්‍ය සේවකයින්ගේ නිවාස හා දේපල වෙනුවෙන් වන්දි ගෙවීම සහ / හෝ ආධාර සැලසීම.**

1987 ජුලි/අගෝස්තු කාලය තුල සිදුවූ දාමරික ක්‍රියා සහ ඉන් පසු සිදුවූ ත්‍රස්තවාදී දාමරික ක්‍රියා හේතුකොට ගෙන තමන්ගේ නිවාස සහ දේපලවලට හානි සිදුවූ රාජ්‍ය නිලධාරීන්ට සහ අධිකරණ නිලධාරීන්ට රුපියල් 1,50,000/= දක්වා වූ එකවර ගෙවන වන්දි මුදලක්, එවැනි ආධාර සඳහා කරනු ලබන ඉල්ලීම් මත ගෙවීමට රජය තීරණය කර ඇත. මෙම චක්‍රලේඛයට අමුණා ඇති ආකෘතිය ප්‍රකාර සකස් කරණ ලද අයදුම්පතක් සහන ලබාගැනීම සඳහා අවස්ථාවෝචිත පරිදි අදාළ අමාත්‍යාංශයේ ලේකම්/පළාත් සභාවේ ප්‍රධාන ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානයා/සංස්ථා සභාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

02. නිවසකට සිදුකර ඇති හානි වෙනුවෙන් වන්දි/සහන සඳහා වන අයදුම්පතක් හානියේ ස්වභාවය සහ වටිනාකම පිළිබඳව ප්‍රාදේශීය සහකාර ආණ්ඩුවේ ඒජන්ත තැනගේ ( මගේ අංක ඒබීකේ/එන්/පොදු/ජීඒ සහ 89.09.21 දිනැති ලිපියෙන් ප්‍රාදේශීය සහකාර ආණ්ඩුවේ ඒජන්තවරුන්ගේ නිල නාමය 89.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පළාත් සභාවෙහි "ප්‍රාදේශීය ලේකම්" යනුවෙන් වෙනස් කරන මෙන් පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්ට මා විසින් උපදෙස් නිකුත් කර ඇති බව කරුණාවෙන් සලකන්න.) සහතිකයක් මගින් තහවුරු කළ යුතුය. ප්‍රාදේශීය සහකාර ආණ්ඩුවේ ඒජන්තවරයා මෙම සහතිකය නිකුත් කිරීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කළමණාකරුගෙන් හෝ දිස්ත්‍රික් ඉංජිනේරු (ගොඩනැගිලි) තැනගෙන් හෝ අනුමත තක්සේරුකරුවෙකුගෙන් හෝ හානියේ ස්වභාවය සහ වටිනාකම පිළිබඳව වාර්තාවක් ලබාගත යුතුය.

03. මෝටර්රථ, ගෘහභාණ්ඩ, ගෙදරදොර උපකරණ සහ අනිකුත් පෞද්ගලික භාණ්ඩවැනි වත්කම්වලට සිදුකර ඇති හානි සඳහා වන්දි/සහන සඳහා වන අයදුම් පත්‍රයක් පළාතේ ප්‍රාදේශීය සහකාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ සහතිකයක් මගින් තහවුරු කළ යුතුය. මෝටර් රථයක් සම්බන්ධයෙන් නම් හානිය සිදුවූ අවස්ථාවේ දී එහි වටිනාකම පිළිබඳව පිළිගත් ගරාජයක අයිතිකරු විසින් නිකුත් කළ සහතිකයක් ද ඉදිරිපත් කළ යුතුය.

04. ඉහත දක්වා ඇති සහතික පදනම් කරගෙන ගෙවිය යුතු වන්දිය/සහනය තීරණය කෙරෙනු ඇත.

05. වන්දි/සහන සඳහා වන අයදුම්පතක් අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ රාජ්‍ය අමාත්‍යවරයාගේ ලේකම්වරයා හෝ අමාත්‍යාංශ කාර්ය මණ්ඩල සම්බන්ධයෙන් නම් ලේකම්වරයා විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු හෝ පළාත් සභාවල නිලධාරීන් සම්බන්ධයෙන් පළාත් සභාවේ ප්‍රධාන ලේකම් හෝ රජයේ දෙපාර්තමේන්තුවලට අයත් නිලධාරීන් සම්බන්ධයෙන් නම් දෙපාර්තමේන්තු ප්‍රධානයා හෝ ඔහුගේ නියෝජ්‍ය ප්‍රධානයා හෝ සංස්ථා සේවකයින් සම්බන්ධයෙන් සභාපති හෝ සාමාන්‍යාධිකාරී හෝ අනුමත කළ යුතුය.

06. පුනරුත්ථාපන හා ප්‍රතිසංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයාගේ ලේකම් වෙතින් මේ සඳහා අවශ්‍ය අරමුදල් ලබාගත යුතුය.

07. මෙම ක්‍රමය 1987.07.01 දින සිට ක්‍රියාත්මක වේ.

( පී.එච්.එම්.ප්‍රනාන්දු )
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

අංක 49/89 දරණ 1989.10.09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ නිවාස සහ දේපලවලට කරනු ලැබ ඇති හානි සඳහා වන්දි/සහන අයදුම්පත්‍රය

1. හානියට පත් දේපල පිහිටා ඇති ලිපිනය:

2. හානිය සිදුවූ දිනය සහ හේතුව:

3. හානියේ ස්වභාවය සහ වටිනාකම:

(අ) නිවාසය

I. වහළ

II. බිත්ති

III. දොර ජනෙල්

IV. වෙනත් අයිතමයන්

V. තමා අයිතිකරුද, කුලී නිවැසියාද යන්න(අයදුම්කරු නිවසේ අයිතිකරු නොවන්නේ නම් නිවස අළුත්වැඩියා කිරීමට අයිතිකරුගේ කැමැත්ත දැක්වෙන ලිපියක් අමුණන්න.)

(ආ) මෝටර් රථ (කිසිවක් ඇත්නම්)

I. රථයේ ලියාපදිංචි අංකය

II. ගත් මිල

III. හානිය සිදුවන අවස්ථාවේ දී ඇස්තමේන්තුගත වටිනාකම

(ඈ) ගෘහ භාණ්ඩ

i. ගත්මිල

ii. භාවිය සිදුවු ,වාවේ දී අයිතමයේ භූගත වටිනාකම

(ඇ) අතිකුත් ගෘහස්ත අ යත්

i. අයිතමය

ii. මිලට ගත් දින

iii. ගත්මිල

iv. භාවිය සිදුවු අවස්ථාවේ දී අයිතමයේ භූගත වටිනාකම

(ඉ). වෙනත් දේ

i. අයිතමය

ii. මිලට ගත් දිනය

iii. ගත්මිල

iv. භාවිය සිදුවු අවස්ථාවේ දී අයිතමයේ භූගත වටිනාකම

සැලකිල්ලට යුතු ප්‍රකාශය

මා විසින් ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත් සත්‍ය බවත්, දී සහතික කර ප්‍රකාශ කරමි.

අත්සන දිනය

මා ඉදිරිපිට අත්සන් කරන ලදී.

සාම විනිසුරු